# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,888—1970 ජනවාරි 9 වැනි සිකුරාදා—1970.1.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 18 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 17 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 22 |
| | | "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක: 10**

අංකය: ඩී/වීඑප්/17/ඒ (V).

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාරතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 ජනවාරි මස 1 වැනි දින සිට යුද්ධ හමුදාවේ ලංකා ස්වේච්ඡා බල සේනාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :—

බ්‍රිවෙට් ලුතිනන්-කර්නල් නෙවිල් එන් සිඩ් ද සිල්වා, ඊ. ඩී., ලං. ශි. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් 26 දින,
කොළඹ දීය.

1-281

**1970 අංකය: 11**

අංකය: ඩී/වීඑප්/51.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාරතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1969 ජූලි මස 1 වැනි දින සිට කපිතාන් (උපකරණ පාලක) වශයෙන්—

ලුතිනන් (උපකරණ පාලක) මහවිදානගේ පියසේන ගුණවර්ධන, ගැ. ශේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් 28 දින,
කොළඹ දීය.

1-308

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


7—බී 69549—10,835 (69/12)

**1970 අංක : 12**

අංකය : සී/වීඑප්/2/ඒ (III)

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

1970 මාර්තු මස 1 වැනි දින සිට, යුද්ධ හමුදවේ ලංකා ස්වේච්ඡා බලසේනාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලදී.

ලුතිනන් ෂා මිලාර්, ල. පා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් 28 දින,
කොළඹ දිය.

1-309

---

**1970 අංක : 13**

අංකය : සී. 22/ආර්ඕපී/90.

## රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 මාර්තු මස 1 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායෙන් විශ්‍රාම ගන්නවා ඇත :—

ලුතිනන් කොමාන්ඩර් පී. සී. නැතැනියෙල්ස්, රා. ලං. නා. හ.

1969 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 14,878 දරණ ගැසට් පත්‍රයේ 1969 අංක 4 බී දරණ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් 27 දින,
කොළඹ දීය.

1-310

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල්. සී.—බී 12/68.

## 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත

### 4 (1) වගන්තිය යටතේ නියෝගය

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතෙහි 4 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ඇමති, ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල ඇමතිතුමාගේ එකඟත්වය ඇතිව, 1966 අංක 10 දරන පනතින් පිහිටුවන ලද රජයේ සංස්ථාවක් වූ ලංකා සංචාරක මණ්ඩලයේ සංචාරක සංවර්ධන යෝජනා ක්‍රමයක කාර්යය උදෙසා මෙහි වූ උපලේඛනයෙහි සඳහන් ඉඩම්, එකී සංචාරක මණ්ඩලය වෙත මෙම නියෝගය මගින් පවරමි.

ජේ. ආර්. ජයවර්ධන,
රාජ්‍ය ඇමති.

1969.12.26 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වලල්ලාවිටි කෝරළයේ (බටහිර) බෙන්තොට ප්‍රා. ආ. නි කොට්ඨාශයෙහි, බෙන්තොට සුළු නගර සභා සීමා ඇතුළත, පහුරුමුල්ල කොට්ඨාශ අංක 1, මලලගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇති,

උතුරට : බෙන්තොට ගඟින්ද ;
නැගෙනහිරට : අංක 2, 3, 4, 5, 8 සහ 9 දරණ බිම් කැබලිවලින්ද,
දකුණට : අංක 12 දරන බිම් කැබැල්ලෙන් හා ;
බටහිරට : මුහුදින් ද.

මායිම්ව, පී. පී. ගා 108 හි කැබලි අංක 1 ලෙස පෙන්නුම් කර ඇත්තා වූද, ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ නීතුන් කරන ලද 1968. 7. 17 දින දරන පැවරීමේ නියෝගයට අමුණා ඇති, සර්වෙයර් ජනරාල් විසින් නිවැරදි බවට සහතික කර ඇති 1968. 6. 25 දින අංක වී 2760 දරන පිඹුරෙහි වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියනසූරිය විසින් මෑතකදී සාදන ලද 1969. 10. 23 දින අංක 190 දරන පිඹුරෙහි පෙන්නුම් කෙරෙන, ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 2, පර්. 23.7 ක්වූ බිම් කොටස.

2. ඉහත කී පහුරුමුල්ල කොට්ඨාශ අංක 1, මලලගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇත්තා වූද,

උතුරට : අංක 13 දරන බිම් කැබැල්ලෙන් ද ;
නැගෙනහිරට : අංක 15, 17, 18, 19, 20, 21, 22, 23 සහ 24 දරන බිම් කැබලිවලින් ද ;
දකුණට : අංක 25 දරන බිම් කැබැල්ලෙන් හා ;
බටහිරට : මුහුදින් ද.

මායිම්ව ඉහතකී පී. පී. ගා 108 හි බිම් කැබලි අංක 16 ලෙස පෙන්නුම් කර ඇත්තා වූද, බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියනසූරිය විසින් මෑතකදී සාදන ලද 1969.10.23 දින අංක 191 දරන පිඹුරෙහි පෙන්නුම් කර ඇත්තාවූද, ප්‍රමාණයෙන් අක්. 1, රූඩ් 0, පර්. 39.3 ක් වූ බිම් කොටස.

3. ඉහතකී පහුරුමුල්ල කොට්ඨාශ අංක 1, මලලගොඩ ග්‍රාමයෙහි, පිහිටා ඇති,

උතුරට : අංක 25 දරන බිම් කැබැල්ලෙන් ද ;
නැගෙනහිරට : අංක 27 දරන බිම් කැබැල්ලෙන් ද ;
දකුණට : 145 දරන බිම් කැබැල්ලෙන් හා
බටහිරට : මුහුදින් ද.

මායිම්ව, ඉහතකී පී. පී. ගා 108 හි බිම් කැබලි අංක 26 ලෙස පෙන්නුම් කර ඇති, බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියනසූරිය විසින් මෑතකදී සාදන ලද 1969. 10. 23 දින අංක 192 දරන පිඹුරෙහි පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 2, පර්. 26.2 ක්වූ බිම් කොටස.

4. ඉහතකී පහුරුමුල්ල කොට්ඨාශ අංක 1 මලලගොඩ ග්‍රාමයෙහි, පිහිටා ඇති,

උතුරට : අංක 26 සහ 27 දරන බිම් කැබලිවලින් ද ;
නැගෙනහිරට : අංක 152 දරන බිම් කැබැල්ලෙන් ද ;
දකුණට : අංක 46 දරන බිම් කැබැල්ලෙන් හා ;
බටහිරට : මුහුදින් ද.

මායිම්ව, ඉහතකී පී. පී. ගා 108 හි බිම් කැබලි අංක 151 ලෙස පෙන්නුම්කර ඇති, බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියසූරිය විසින් මෑතකදී සාදන ලද, 1969. 10. 23 දින අංක 193 දරන පිඹුරෙහි පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් අක්. 1, රූඩ් 1, පර්. 0.5 ක්වූ බිම් කොටස.

5. ඉහතකී පහුරුමුල්ල කොට්ඨාශ අංක 1, මලලගොඩ ග්‍රාමයෙහි, පිහිටා ඇති,

උතුරට : අංක 148 දරන බිම් කැබැල්ලෙන් ද ;
නැගෙනහිරට : දුම්රිය මාර්ගය සඳහා වෙන්කර ඇති බිම් තීරයෙන් සහ අංක 150 දරන බිම් කැබැල්ලෙන් ද ;
දකුණට : දුම්රිය මාර්ගය සඳහා වෙන්කර ඇති බිම් තීරයෙන් හා
බටහිරට : අංක 148 දරන බිම් කැබැල්ලෙන් ද.

මායිම්ව, ඉහතකී පී. පී. ගා 108 හි බිම් කැබලි අංක 149 ලෙස පෙන්නුම් කර ඇති, බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියනසූරිය විසින් මෑතකදී සාදන ලද 1969.10.23 දින අංක 194 දරන පිඹුරෙහි පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 2.0 ක් වූ බිම් කොටස.

1-302

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිටි පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවාසේ සැලකෙන අල් හාජ් ඇම්. එච්. ඇ[illegible] රෙයාල් මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියම කො[illegible] පත් කළ සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආ[illegible] පනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ [illegible] කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමන් විසින් නිහාල් කනකරත්[illegible] මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්[illegible] සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කර[illegible] ලැබේ.

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශ[illegible]
ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

1-238

## මුද්දර ආඥාපනත

### 2 වගන්තිය යටතේ නියෝගය

1959 අංක 21 දරන පනතින් සංශෝධිත (247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතෙහි 2 වන වගන්තියේ (2) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම, යම්කිසි නිශ්චල දේපොලක් මාරු කිරීමට අදාල වූ යම්කිසි නීත්‍යානුකූල ලියවිල්ලක් ලංකාණ්ඩුවට පක්ෂව හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ ලංකාණ්ඩුව මගින් ක්‍රියාවේ යොදවන අවස්ථාවකදී ඉන්දියාවේ දී මුද්දර බද්දක් අයකළ නොහැකි වීම ගැන සෑහීමට පත්ව,

(1) මෙම ආඥාපනත ගැසට් පත්‍රයේ පළ කළ දින සිට පූර්වෝක්ත වගන්තියේ (i) උප වගන්තියට වූ අතුරු විධානයේ (ii) ඡේදය මගින් ප්‍රදානය කරන ලද නිදහස් කිරීම, ඉන්දියා ආණ්ඩුවට පක්ෂව හෝ ඉන්දියා ආණ්ඩුව වෙනුවෙන් හෝ ඉන්දියා ආණ්ඩුව මගින් ක්‍රියාවේ යෙද වූ යම්කිසි නීත්‍යානුකූල ලියවිල්ලකට අදාල වන ලෙසට මෙයින් ප්‍රකාශයට පත් කරන අතර,

(2) පූර්වෝක්ත වගන්තිය යටතේ පනවද ලදුව 1955 පෙබරවාරි 25 වැනි දින අංක 10,769 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ඉන්දියාවට අදාල වූ නියෝගය පූර්වෝක්ත දිනයේ සිට මෙයින් අවලංගු කරනු ලැබේ.

යූ. බි. වන්නිනායක,
මුදල් ඇමති.

1969.12.21.
කොළඹ.

1-257

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති, මහබාලගේ දොන් හෙන්රි ජයවර්ධන වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මාවෙත පවරා ඇති බලතල උඩ, මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. ඩි. එච්. ජයවර්ධන,
විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති.

1969 දෙසැම්බර් 27 දින,
කොළඹ දීය.
කොඳ 2/පුඉ/109.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ බම්බලපිටියේ ෂබරි ගාඩින්ස් හි පිහිටි වරිපනම් අංක 20 සහ 21 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මැනීම් ඇති අ. 0, රූඩ් 3, පර්. 32.80 ක් පමණ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටස :—

උතුරට : ෂබරි ගාඩින්ස් පාර ;

නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් "ඇම්" දරණ කොටස ;

දකුණට : පිට්පිට් පාරේ වරිපනම් අංක 18, 22, 24 හා 28 දරණ දේපල ;

බස්නාහිරට : වරිපනම් අංක 35 දරණ දේපල.

1-298

---

එල්.ඩී.—බී 194/39.

## රජයේ මිනින්දෝරු සංගමය—ආඥාපනත

රජයේ මිනින්දෝරු සංගමය විසින් රජයේ මිනින්දෝරු සංගම් ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ (288 පරිච්ඡේදය) සම්පාදනය කරන ලද සහ ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ ඇමතිවරයා විසින් එම වගන්තියේ අංක 2 උප වගන්තිය යටතේ අනුමත කරන ලද්දකි.

එම්. ශ්‍රී කාන්තා,
ස්ථිර ලේකම්,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශය.

කොළඹ, 1969 දෙසැම්බර් 24 දින.

### ව්‍යවස්ථාව

අංක 14,421 හා ජූනි 11 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළවූ ව්‍යවස්ථාවෙන්, අවසන් වරට සංශෝධිත අංක 10,436 හා 1952 අගෝස්තු 22 වැනි දින ගැසට් පත්‍රයේ පළවූ රජයේ මිනින්දෝරු සංගමයේ ව්‍යවස්ථා පහත සඳහන් පරිදි තවදුරටත් මෙහිලා සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 1 වැනි කොටසෙහි—

(අ) එහි 11 (අ) ව්‍යවස්ථාවෙහි (7) වෙනි ඡේදයට පසුව පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(8) 11 අ (1) ව්‍යවස්ථාව යටතේ නාම යෝජනා නොමැති හෝ නාම යෝජනා ප්‍රමාණවත්ව ලැබී නොමැති අවස්ථාවල දී, අපේක්ෂකයන්ගේ නම් මහා සභාරැස්වීමේදීම යථා පරිදි ඡන්දය විමසීම සඳහා යෝජනා කොට ස්ථිර කළ යුතුය.

(ආ) එහි 12 වැනි ව්‍යවස්ථාවෙහි "දිවයිනෙන්" යන වචන වෙනුවට "දිවයිනෙන් ............................ හෝ කාරක සභාව විසින් විශේෂ ලෙස සලකනු ලැබෙන අවස්ථාවන්" යන වචන යෙදීමෙන්.

(ඇ) එහි 19 වැනි ව්‍යවස්ථාවෙහි 2 වැනි ඡේදයෙහි "සෑම නියෝගයක් හෝ දැන්වීමක්" යන වචන වෙනුවට "සෑම දැන්වීමක්" යන වචන යෙදීමෙන්.

(ඈ) 26 ව්‍යවස්ථාවට අනතුරුව පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් :—

26 අ (i) 24 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන කෙසේ වෙතත්, කිසිම නිලධාරියකු හෝ කාරක සභිකයකු කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් ලේකම්තුමා විසින් දින 14 කට පෙර සාමාජිකයන්ට එබඳු යෝජනාවක් පිළිබඳව දැනුම් නොදී මහා සභා රැස්වීමේ දී සාකච්ඡා නොකළ යුතුය.

(ii) සංගමයේ විශේෂ මහා සභා රැස්වීමකදී පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්ද සංඛ්‍යාවකින් නිලධාරියකු හෝ කාරක සභිකයකු කෙරේ විශ්වාසය නොමැති බව ප්‍රකාශ කෙරෙන යෝජනාවක් සම්මත වූ විගස ඔහුට අවිඝාතානුකූලව නිලය දැරීම හෝ කාරක සභාවේ සාමාජිකත්වය දැරීම අහිමි වන්නේ ය.

(iii) ලේකම් ධුරයේ හැර එසේ ඇතිවූ ඕනෑම පුරප්පාඩුවක්, එබඳු විශේෂ මහා සභා රැස්වීමක දී එහි පැමිණ සිටි සාමාජිකයන් අතුරෙන් ඡන්ද විමසීමකින් තෝරා පිරවිය යුතුවේ. ලේකම් කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් ලැබුණ අවස්ථාවකදී එකී යෝජනාව එම විශේෂ මහා සභා රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් සම්මත කරනු ලැබූ විට එම විශේෂ මහා සභාවේදීම නව ලේකම් වරයෙකු ඡන්දයෙන් තෝරා ගැනීමට මේ ව්‍යවස්ථාව යටතේ ලේකම් හෝ සභාපතිවරයා හෝ අවශ්‍ය පියවර ගත යුතු ය" හා

(2) එහි 11 වැනි කොටසෙහි 11 වැනි ව්‍යවස්ථාවේ 4 වෙනි ඡේදයෙහි "දිවයිනෙන්" යන වචන වෙනුවට "දිවයිනෙන් හෝ අරමුදල් කමිටුව මගින් විශේෂ ලෙස සලකනු ලැබෙන අවස්ථාවක්" යන වචන යෙදීමෙන්.

1-280

---

## වෂ් 1954 සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) රෙගුලාසි

### වේතන මිනිශ්චය මණ්ඩලවලට පත් කෙරෙන සභික නාම ලේඛනය

(1) කම්කරු කොමසාරිස්වරයාගෙන් සහ

(2) 1970 ජනවාරි මස 1 වැනි දින සිට (129 වැනි පරිච්ඡේදය වන) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 25 (1) වගන්තිය යටතේ ඇමති වරයා විසින් පත් කරනු ලැබ සිටින, පහත නම් දක්වෙන තැනැත්තන්ගෙන්—

සංයුක්ත වන බව වර්ෂ 1954 ඔක්තෝබර් 15 වැනි දින හා අංක 10,724 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1954 සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) ව්‍යවස්ථා සංග්‍රහයේ 31 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) සේවා නියෝජිතවරු :

1. එම්. වයි. ප්‍රේමදාස මහතා
2. මුදලිගේ එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මහතා

3. එච්. කේ. ධම්දාස මහතා
4. එච්. ජේ. සමරකෝන් මහතා
5. වයි. පී. මුතුකුමාරණ මහතා
6. එම්. ඒ. පියතිස්ස මහතා
7. ජී. පී. කාරියවසම් මහතා
8. ටී. ඩබ්ලිව්. ටිව් මහතා
9. සී. වර්ණකුලසූරිය මහතා
10. ඒ. ඒ. එදිරිසිංහ මහතා
11. ඩී. එස්. ඉලයපෙරුම මහතා
12. කේ. වී. ගුණසේන මහතා
13. එච්. පෝල් සිල්වා මහතා
14. සී. ෆ්‍රෙඩි ජයසිංහ මහතා
15. ජී. ටී. එෆ්. ප්‍රනාන්දු මහතා
16. ඩොනල්ඩ් රත්නවීර මහතා
17. එම්. ඩබ්ලිව්. ජයරත්නම් මහතා
18. ටොම් ප්‍රනාන්දු මහතා
19. ඒ. සංඝදාස සිල්වා මහතා
20. ජෝසි එෆ්. පෙරෙසිරා මහතා
21. ජේ. අබේවික්‍රම මහතා
22. එන්. ෂෙවක්‍රම මහතා
23. එම්. රෂීක් ක්‍රැඩර් මහතා

(ආ) සේවක නියෝජිතවරු :

1. විමලසිරි ද මැල් මහතා
2. ඒ. දෙන් ප්‍රේමදාස මහතා
3. එන්. ෂන්මුගදාසන් මහතා
4. ආර්. ජී. නාදන් මහතා
5. තිලක කුලසේකර මහතා
6. එච්. සී. වැඩිවර්ධන මහතා
7. සයිමන් අධිකාරි මහතා
8. ආර්. සීතළන් අයියර් මහතා
9. එල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
10. එස්. සී. ප්‍රනාන්දු මහතා
11. එස්. සෙල්ලයියා මහතා
12. ඩබ්ලිව්. සිරිමාන්න මහතා
13. කේ. කුලවීරසිංහම් මහතා
14. ඒ. ඩී. ඊ. විජේතුංග මහතා
15. වෝල්ටර් ජෝතිපාල මහතා
16. ඩොනල්ඩ් රත්නවීර මහතා
17. ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු මහතා
18. පී. සුමතිරත්න මහතා
19. එම්. බී. එච්. එම්. පීරිස් මහතා
20. ඔස්වින් ප්‍රනාන්දු මහතා
21. ආර්. සී. ලංකාතිලක මහතා
22. ඩී. එස්. විජයරත්න මහතා
23. ඩබ්ලිව්. කේ. විජේමාන්න මහතා

(ඇ) නම් නියමකොට පත්කළ සාමාජිකවරු :

1. ඊ. ආර්. විද්‍යාම්නායක මහතා
2. ඒ. එච්. එම්. ෆවුසි මහතා
3. කේ. බගස්ටින් ඩයස් මහතා
4. ඩබ්ලිව්. මාලිමාරච්චි මහතා
5. ඩී. ඇල්ෆ්‍රඩ් ද සිල්වා මහතා
6. ටී. සිරිදරන් මහතා
7. ජේ. ඩී. සී. පෙරේරා මහතා
8. ඒ. ඩී. කපාගරත්න මහතා
9. ඩී. ඊ. සිම්ත්‍රාරච්චි මහතා
10. වී. විමලවන්දිරන් මහතා
11. ආර්. ආර්. සෙල්වදෙරෙයි මහතා

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1969 දෙසැම්බර් මස 22 දින,
කොළඹ දී ය.

1-272

## 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

1963 අංක 5 දරන පනතින් සංශෝධිත, 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 37 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනසතු සේවා ඇමති, විතාන ආරච්චිගේ සුගතදාස වන මම, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1964 ජනවාරි 9 වැනි දින අංක 13,910 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද (අංක 74 දරන) සතුකිරීමේ ආඥාව :—

(අ) ඒ ආඥාවට යාකොට ඇති උපලේඛනයේ 61 වෙනි අංකයෙහි විස්තර කරනු ලැබුවා වූද, මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩාත් සම්පූර්ණව විස්තර කරනු ලැබුවා වූද, දේපළවලට ; හා

(ආ) ඉහත කී දේපළවල පිහිටා තිබෙන සියළුම ගොඩනැගිලිවලට ;

අදාල වන ප්‍රමාණයට මේ ආඥාවෙන් අවලංගු කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා ඇමති.

1969 දෙසැම්බර් මස 18 දින.
කොළඹ දී ය.

### උපලේඛනය

61. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල නගර සභා සීමාව තුළ කුරුණෑගල, නුවර පාරේ පිහිටි, උතුරට එම ඉඩමේම "ඒ" දරන බිම් කට්ටියෙන්ද, නැගෙනහිරට නුවර පාරෙන්ද, දකුණට එම ඉඩමේම කොටසක් වූ අඩි 33 ක් පළල් වූ පාරෙන්ද, බස්නාහිරට වරිපනම් අංක 72/1 දරන එම ඉඩමේම ඉතිරි කොටසින් ද මායිම් වූ, බලයලත් මිනින්දෝරු, ජී. ඒ. ද සිල්වා විසින් සම්පාදිත, 1952 පෙබරවාරි 14 වෙනි දිනැති අංක 5603 ඒ දරන සැලැස්ම ප්‍රකාර, ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් විසිදෙකයි දශම හයයි එකක් (අ. 0, රූ. 0, පර්. 22.61) වූ, නුවර පාරේ වරිපනම් අංක 74 දරන, එකී අංක 5,603 ඒ දරන සැලැස්මේ 'බී' දරන බිම් කට්ටිය වශයෙන් ලකුණු කර ඇති සම්පූර්ණ බිම් කොටස.

(එල්ඒ/බී/275) (සෙල්—නුවර පාර, කුරුණෑගල)
(ඩී. පී. ඕ. 155)

1-268

---

## 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

1963 අංක 5 දරන පනතින් සංශෝධිත, 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 37 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනසතු සේවා ඇමති, විතාන ආරච්චිගේ සුගතදාස වන මම, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1964 ජනවාරි 9 වැනි දින අංක 13,910 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද (අංක 74 දරන) සතුකිරීමේ ආඥාව :—

(අ) ඒ ආඥාවට යාකොට ඇති උපලේඛනයේ 71 වෙනි අංකයෙහි විස්තර කරනු ලැබුවා වූද, මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩාත් සම්පූර්ණව විස්තර කරනු ලැබුවා වූද, දේපළවලට ; හා

(ආ) ඉහත කී දේපළවල පිහිටා තිබෙන සියළුම ගොඩනැගිලිවලට ;

අදාළ වන ප්‍රමාණයට මේ ආඥාවෙන් අවලංගු කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා ඇමති.

1969 දෙසැම්බර් මස 18 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

පහළ බුලත්ගම කෝරළේ, මෙගොඩපොත පත්තුවේ, සහ පහළ බුලත්ගම කෝරළේ, මෙගොඩපොත පත්තුවේ, යටියන්තොට පිහිටි, බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සම්පාදිත, 1956 අගෝස්තු 26 වෙනි දිනැති අංක 248 දරන සැලැස්මේ ප්‍රකාර, උතුරට : එම ඉඩමේම කොටසකින් (වොලිබෝල් ක්‍රීඩාංගනය) ද, නැගෙනහිරට : එකී සැලැස්මේ අංක 1 සහ 2 දරන බිම් කට්ටිවලින් ද, දකුණට : එම්. පී. ගෝමස් මහතුන් සහ සමාගමේ ස්ථානයෙන් ද සහ බස්නාහිරට : එකී නැකතිගෙහේනේ ඉතිරි කොටසින් ද මායිම් වූ, ප්‍රමාණයෙන් අක්කර නැත. රූඩ් නැත, පර්චස් නවයයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්. 9.47) වූ, මහ වීදියේ වරිපනම් අංක 109 දරන, එකී අංක 248 දරන සැලැස්මේ අංක 4 බිම් කට්ටිය වශයෙන් ලකුණු කර ඇති නැකතිගෙහේන නමැති සම්පූර්ණ බිම් කොටස.

ඉහත කී යටියන්තොට පිහිටි, මහවීදියේ වරිපනම් අංක 109 දරන ස්ථානයේ කොටසක් වූ, මින්මතු සඳහන් වන සැලැස්මේ අංක 2 බිම් කට්ටිය වශයෙන් දක්වා ඇති බලයලත්

මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සම්පාදිත 1956 අගෝස්තු 26 දිනැති අංක 248 දරන සැලැස්ම ප්‍රකාර, උතුරට: එකී සැලස්මේ අංක 1 බිම් කට්ටියෙන් ද, නැගෙනහිරට: එකී සැලැස්මේ අංක 3 දරන බිම් කට්ටිය ඇතුළුව කොළඹ-හැටන් ප්‍රධාන පාරෙන් ද, දකුණට: එම්. පී. ගෝමස් මහත්වරු සහ සමාගම පිහිටුවා ඇති ස්ථානයෙන් ද, බස්නාහිරට: එකී සැලැස්මේ අංක 4 දරන බිම් කට්ටියෙන් ද මායිම් වූ, ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් හයයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.85) වූ සම්පූර්ණ බිම් කොටස, සහ

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් සහ පහළ බුලත්ගම කෝරළේ, මෙගොඩපොත පත්තුවේ, යටියන්තොට ඊහිපි, බලයලත් මිනින්දෝරු සහ මට්ටම් ශිල්පී, සී. එච්. ජේ‍ට විසින් සම්පාදිත, 1954 අගෝස්තු 21 දිනැති අංක 74 දරන සැලැස්ම ප්‍රකාර, උතුරට: ගාල්ලේ බිෂොප් තුමාට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට: හැටන්-කොළඹ ප්‍රධාන පාරෙන් ද, දකුණට: මිනින්දෝරු බී. ජේ තීඩමන් විසින් සම්පාදිත, 1928 ඔක්තෝබර් දිනැති අංක 2041 දරන සැලැස්මේ දක්වා ඇති නැකතිගෙහේනේ "බී" දරන බිම් කට්ටියෙන් ද, බස්නාහිරට: එම ඉඩමේම කොටසකින් ද මායිම් වූ, ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් පහයි දශම හයයි හයක් (අ. 0, රූ. 0, පර්. 5.66) වූ මහවීදියේ වරිපනම් අංක 109 දරණ ස්ථානයේ කොටසක් වූ, අංක 74 දරන සැලැස්මේ "ඒ" යනුවෙන් ලකුණු කර ඇති නැකතිගෙහේන නමැති සම්පූර්ණ බිම් කොටස.

(එල්ඒ/බී/316) (ෂෙල්-යටියන්තොට)

(ඩී. වී. ඕ. 149)

1—269

---

## 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

1963 අංක 5 දරන පනතින් සංශෝධිත, 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 37 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනසතු සේවා ඇමති, වීනාන ආරච්චිගේ සුගතදාස වන මම, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1962 අප්‍රේල් 27 වැනි දින අංක 13,050 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද (අංක 19 දරන) සතුකිරීමේ ආඥාව :—

(අ) ඒ ආඥාවට යාකොට ඇති උපලේඛනයේ 15 වෙනි අංකයෙහි විස්තර කරනු ලැබුවා වූද, මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩාත් සම්පූර්ණව විස්තර කරනු ලැබුවා වූද, දේපළ වලට ; හා

(ආ) ඉහත කී දේපළවල පිහිටා තිබෙන සියළුම ගොඩනැගිලිවලට ; අදාල වන ප්‍රමාණයට මේ ආඥාවෙන් අවලංගු කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා ඇමති.

1969 දෙසැම්බර් මස 18 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

15\. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ නගරසභා සීමාව තුළ, බ්ලූමැන්ඩෝල් පාර, උතුරු ස්කිනර්ස් පාර සහ කොටහේන නැගෙනහිර ඡන්දදායක කොට්ඨාශය අතර පිහිටි, උතුරට: අංක 773 ඒ දරන සැලැස්මේ "ඒ 1" බිම් කට්ටියෙන් ද, නැගෙනහිරට: බ්ලූමැන්ඩෝල් පාරෙන් ද, දකුණට: අංක 773 ඒ දරන සැලැස්මේ "ඒ 3" දරන බිම් කට්ටියෙන් සහ උතුරු ස්කිනර්ස් පාරේ අංක 355 දරන ස්ථානයෙන් ද, බස්නාහිරට: උතුරු ස්කිනර්ස් පාරෙන් ද මායිම් වූ, බලයලත් මිනින්දෝරු, පී. අතුරලිය විසින් සම්පාදිත, 1956 නොවැම්බර් 10 වෙනි දිනැති අංක 773 ඒ දරන සැලැස්මේ "ඒ 2" බිම් කට්ටිය වශයෙන් ලකුණු කර ඇති, ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් දෙකයි, පර්චස් දහයයි දහයෙන් හතක් (අ. 0, රූ. 2, ප. 10 7/10) වූ, උතුරු ස්කිනර්ස් පාරේ වරිපනම් අංක 353 දරන එගොඩවත්ත වලව්ව හෙවත් ග්‍රීන් ලොජ් නමැති ඉඩමෙන් බෙදා මායිම් කළ සම්පූර්ණ බිම් කොටස.

(එල්ඒ/සී/89) (එසෝ—උතුරු ස්කිනර්ස් පාර)

(ඩී. වී. ඕ. 156)

1—270

A 2

අංකය : සී/අයි. 1028

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා මෝටර් සේවක සමිතිය, 123, යූනියන් පෙදෙස, කොළඹ 2 හා සිරි කැරියර්ස් ලිමිටඩ්, අංක 57, ගලු පාර, කොළඹ 4 අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති නැන්පත් මොහමඩ් හනිපා මොහමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පමුණුව, පිළිමතලාවේ සමාදාන විනිශ්චයකාර ඒ. ජයසිංහ මහතා මෙයින් පත් කරනු ලැබේ.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1969 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

(243-44/68.)

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය 131 වන අධිකාරය, කාර්මික ආරාවුල් පනත

ලංකා මෝටර් සේවක සමිතිය,
123, යූනියන් පෙදෙස,
කොළඹ 2
සිරි කැරියර්ස් ලිමිටඩ්,
අංක 57, ගාලු පාර, කොළඹ 4.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතු වී පවත්නේ සිරි කැරියර්ස් ලිමිටඩ් හි පාලක පක්ෂය විසින් පහත දක්වෙන සේවකයන්ගේ සේවය අහෝසි කිරීම යුක්තිසහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් වේ.

ඇම්. එච්. මොහොමඩ් මහතා
ඩබ්. ඒ. ධර්මදාස මහතා
බැනට් ද සිල්වා මහතා
එච්. ඩී. සිරිසේන මහතා
කේ. ඩී. සිරිසේන මහතා
කේ. ජී. ජේම්ස් මහතා
ඇල්. මහින්ද මහතා
ඇම්. පී. වී. පෙරේරා මහතා
ඩබ්. දිනෝරිස් මහතා

1969 දෙසැම්බර් මස 21 වැනි ද වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

1-271

---

අංකය : ඩබ්ලිව්. 105/එම්/7.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා කම්කරු සංගමය, 72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 7, එක් පාර්ශ්වයක් ලෙස හා අනෙක් පාර්ශ්වය ලෙස කොළඹ 1, රැජින වීදියේ අංක 45 දරණ ස්ථානයේ සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සමාගම බාරේ දික්ඔය, ජේපඩයිස් වතුයායේ අයිතිකරුවන් වන ලංකා ප්ලාන්ටේෂන්ස් කොම්පැනි ලිමිටඩ් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද :

කම්කරු හා රැකීරක්‍ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහොමඩ් හනීෆා මොහොමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක X දරන කම්කරු විනිශ්චය සභාව වෙත මෙයින් යොමු කරමි.

ඇම්. එච්. මොහොමඩ්,
කම්කරු හා රැකීරක්‍ෂා කටයුතු පිළිබඳ ඇමති.

1969 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

241-42/68

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය, කාර්මික ආරාවුල් පනත

ලංකා කම්කරු, සංගමය,
72, ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 7 එක් පාර්ශ්වයක් වශයෙන් ද

සහ

අනෙක් පාර්ශ්වය ලෙස, කොළඹ 1 රජින වීදියේ අංක 45 දරණ ස්ථානයේ සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සමාගම බාරේ, දික්ඔය, පෝඩයිස් වතුයායේ අයිතිකරුවන් වන ලංකා ප්ලාන්ටේෂන්ස් කොම්පැනි ලිමිටඩ්.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී පවතින කරුණ නම් වී. මරුතවීරන්ගේ සේවය දික්ඔය ෆෝඩයිස් වතුයායේ පාලක පක්‍ෂය විසින් අත්හිටවීම යුක්ති සහගතද නොඑසේ නම් ඔහුට කුමණ සහනයක් හිමිද යන්න වේ.

1969 දෙසැම්බර් මස 21 වැනි දා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

1-273

---

## 1958 අංක 1 දරණ කුඹුරු පනතේ 38 ආ (1) දරන වගන්තිය යටතේ ආඥාව

1958 අංක 30, 1961 අංක 61, 1964 අංක 11 සහ 1966 අංක 25 දරණ පනත් වලින් සංශෝධිත 1958 අංක 1 දරණ කුඹුරු පනතේ 38ආ වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත් තුව ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, අංක 87/23 දරණ යක්කාවිට ගොවි කාරක සභාව, මෙම පනතින් පැවරුන යුතුකම් ඕනෑකමින්ම පැහැර හැරීම හා ඒවා ඉටු කිරීමෙහි ලා විෂමාචාරය, අදක්‍ෂතාවය හා නොමනා පාලනය ඇති වග ඔප්පු කිරීමට ප්‍රමාණවත් කරුණු ඇතැයි සෑහීමට පත්ව, මෙම ආඥාවෙන් එම ගොවි කාරක සභාව විසුරුවා හරිමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සෙවා කොමසාරිස්.

1969 දෙසැම්බර් මස 26 දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 537,
කොළඹ 7.

1-274/1

---

## නිවේදනයයි

**1958 අංක 1 දරන කුඹුරු පනතේ 38 (ආ) (2) දරන වගන්තිය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත් තුව ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, අංක 87/23 දරණ යක්කාවිට ගොවි කාරක සභා බල ප්‍රදේශයේ 1958 අංක 30, 1961 අංක 61, 1964 අංක 11 සහ 1966 අංක 25 දරණ පනත් වලින් සංශෝධිත 1958 අංක 1 දරණ කුඹුරු පනතේ 38ආ (2) දරණ වගන්තිය යටතේ ගොවිකාරක සභාවක බලතල, යුතුකම් හා කාර්යයන් සියල්ලම ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාවන්හි යෙදවීම පිණිස ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ, ප්‍රාදේශීය නිලධාරි මිහිඳ කුලසූරිය ලෙස්ලි සතුර්නියස් පෙරේරා ධර්මරත්න මහතාට බලය පවරා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. බී. සේනානායක,
ගොවිජන සෙවා කොමසාරිස්.

1969 දෙසැම්බර් මස 26 දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 537,
කොළඹ 7.

1-274/2

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා රජයේ උකස් බැංකුව

**ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත (398 උපනාාශය)**

ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 උපනාාශය) 93(1) (ඊ) දරණ ඡේදය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්පාදිත මෙහි පහත සඳහන් නීතිය මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. බී. කළුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1969 නොවැම්බර් ..., කොළඹ.

ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 උපනාාශය) 93(1) (ඊ) දරණ ඡේදය යටතේ සම්පාදිත 1 හා 2 දරණ නීති අවලංගු කොට පහත දැක්වෙන නීතිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

" ප්‍රස්තුත අවස්ථාවේදී ණය මුදල සම්බන්ධිතව නියමිත දිනයේදී ගෙවිය යුතු කොටස් මුදල හා පොළිය හෝ තත්ත්වානුකූලව, සම ගෙවීම හෝ වෙනත් ගෙවීම් කිරීම පැහැර හරින හෝ නොසලකා හරින සැම ණය ගණුවෙක්ම ණය මුදල ලබා ගැන්ම සඳහා එළඹි බැඳුම්කරයෙන් නිශ්චිත වූ, එවැනි කොටස් මුදල් හා පොළිය හෝ සම ගෙවීම් හෝ, වෙනත් ගෙවීම්වලට අමතරව, ගෙවීමට ඇති මුල් මුදලේ ශේෂය සඳහා පූර්වෝක්ත ගෙවීම් නියමිත වූ දින සිට තථ්‍ය ගෙවීම කරනු ලබන දින දක්වා වර්ෂයකට සියයට 1 බැගින් දඩ පොළියක් වශයෙන් තවදුරටත් මුදලක් ගෙවිය යුතුය. මෙහිදී, එක් නිශ්චිත ගෙවීමකට වඩා පැහැර හැර ඇති හෝ පැහැර හරින්නා වූ ණය ගණුවෙක් නම්, ඉනික්බිතිව පැහැර හැරි නිශ්චිත ගෙවීම සඳහා දඩ පොළිය ගණනය කිරීමේ දී එක් නිශ්චිත ගෙවීමක් සඳහා දඩ පොළිය ගණනය කිරීමට ආවරණය වූ කාලය අත් හරිනු ඇත."

1-393

---

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය) 227 (4) වගන්තිය යටතේ කොලොන්න ට්‍රාන්ස්පෝට් කොම්පැනි ලිමිටඩ් සමාගම විසුරුවා හැරීමේ දැන්වීම

**සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම**

ඇවර කරනු ලැබූ කොලොන්න ට්‍රාන්ස්පෝට් කොම්පැනි ලිමිටඩ් සමාගමේ ගණන් බේරා වසා දැමීම පිළිබඳ අවසාන රැස්වීමේ වාර්තාව හා ඇවරකරුගේ ගිණුම් පිටපතක් ලැබී 1969 දෙසැම්බර් 26 වැනි දින ලියා පදිංචි කළ බැවින් යථෝක්ත දිනයේ සිට තෙමසක් ඉකුත් වූ පසු කොලොන්න ට්‍රාන්ස්පෝට් කොම්පැනි ලිමිටඩ් සමාගම, සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) 227 (4) වැනි වගන්තිය යටතේ විසුරුවා හරිනු ලැබූ ලෙස සැලකෙන බව දැන ගන්න.

ජේ. ඇෆ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1969 දෙසැම්බර් 29 වැනි දින,
කොළඹ 1, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

1-312

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් ... | 69.12. 5 සිකුරාද ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 සිකුරාද ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 සිකුරාද ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 සිකුරාද ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**1970**

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි ... | 70. 1. 2 සිකුරාද ... | 69.12.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1. 9 සිකුරාද ... | 70. 1. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1.16 සිකුරාද ... | 70. 1. 8 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 1.23 සිකුරාද ... | 70. 1.16 සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 1.29 බ්‍රහස්පතින්ද ... | 70. 1.21 බදාදා | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි ... | 70. 2. 5 බ්‍රහස්පතින්ද ... | 70. 1.28 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 2.13 සිකුරාද ... | 70. 2. 5 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | 70. 2.20 සිකුරාද ... | 70. 2.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 2.27 සිකුරාද ... | 70. 2.20 සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද ... | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 3.13 සිකුරාද ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද ... | 70. 3.20 සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි